# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2411/05 - 2024 නොවැම්බර් මස 18 වැනි සඳුදා - 2024.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/262.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.12.22 වැනි දින අංක 2363/70 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.12.15 වැනි දින දරන නියෝගයෙන්,

පී.ජී. නන්දන කුමාර බණ්ඩාර මයා, වම්බටු යාය, හුංගන්වෙල, නාලන්ද.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2023.11.29 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතීඥ ජනජිත් ද සිල්වා මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතීඥ ජනජිත් ද සිල්වා මයා බේරුම්කාර ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2023.12.15 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය .

2024 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2018/262.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය.

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

පී.ජී. නන්දන කුමාර බණ්ඩාර මයා, වම්බටු යාය, හුංගන්වෙල, නාලන්ද.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගැටහැත්ත, රාජ්‍ය සේවක ගම්මානය, බී 27 හි පී.එච්. ආනන්ද මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය .

2024 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2018/262.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී.ජී. නන්දන කුමාර බණ්ඩාර මයා, වම්බටු යාය, හුංගන්වෙල, නාලන්ද.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මාතලේ, කලුදෑවල ප්‍රාදේශීය වැඩපළේ සේවය කරන ලද පී.ජී. නන්දන කුමාර බණ්ඩාර මහතාට 2008.10.13 වැනි දින සිට 2015.03.07 දින දක්වා වැඩ තහනම් කර සිටි කාලයට අදාළව වැටුප් නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද ? යන්න හා අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0090

---

මගේ අංකය: IR/COM/01/2024/53.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය.

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක. 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. සුමිත්‍රා හසලක (ප්‍රයිවට්) ලිමිටඩ්, රෝහල පාර, හසලක.

2. සුමිත්‍රා හසලක (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක. 33, තෙලහපාත පාර, වත්තල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩමාදුව, ද විලේජ්, 202/බී/61 හි නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය .

2024 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2024/53.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක. 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. සුමිත්‍රා හසලක (ප්‍රයිවට්) ලිමිටඩ්, රෝහල පාර, හසලක.

2. සුමිත්‍රා හසලක (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක. 33, තෙලහපාත පාර, වත්තල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

"2024 ජනවාරි සිට රු. 10,000/= ක වැටුප් වැඩි කිරීමක් ලබාදෙන ලෙස නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය විසින් කරන ලද ඉල්ලීමට ආයතනය කටයුතු කර ඇති ආකාරය මඟින් සේවකයන්ට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0091

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.